# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## 10 ශ්‍රේණිය

### කාර්ය පත්‍රිකා සංග්‍රහය




**කලාප අධ්‍යාපන කාර්යාලය**

**අම්පාර**

විෂය - ව්‍යවසායකත්ව අධ්‍යයනය

ශ්‍රේණිය - 10 ශ්‍රේණිය

පාඩම් ඒකකය - ව්‍යවසායකත්ව සංකල්පය

ගුරුවරයාගේ නම - ඩී.කාන්තිලතා, පාසල - අම්/කුමාරිගම මහා විදුහල

---

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

01.ව්‍යවසායකයකු සැම විටම,

1) වෙනසක් සොයයි. 2) අභියෝග සොයයි.

3) ලාභ අරමුණු කර ගනියි. 4) නිෂ්පාදනයක් කරයි.

02. සැම ව්‍යවසායකයෙකුටම තම සාර්ථකත්වය සඳහා තිබිය යුතු මූලික ලක්ෂණය වන්නේ ,

1) පැහැදිලි අරමුණක් තිබීමය. 2) පැහැදිලි දැක්මක් තිබීමය.

3)ආත්ම විශ්වාසයක් තිබීමය. 4) ඕනෑම අරමුණක් ජයගත හැකි වීමය.

03.ව්‍යවසායකයකු,

1) උපතින්ම බිහිවන පුද්ගලයෙකි.

2) නිර්මාණය කළ හැකි පුද්ගලයෙකි.

3) උපතින් බිහිවන අතර,නිර්මාණයද කළ හැකි පුද්ගලයෙකි.

4) උපතින් බිහිවන අතර,නිර්මාණය කළ නොහැකි පුද්ගලයෙකි.

04."සැම ව්‍යවසායකයෙකුටම තම අනාගතය පිළිබඳ පැහැදිලි අරමුණක් හා ඉලක්කයක් ඇත" මෙයින් ප්‍රකාශවන ව්‍යවසායකත්ව ගුණාංගය වන්නේ,

1) ප්‍රතිපත්ති 2) දැක්ම

3) නිර්මාණශීලිත්වය 4) නම්‍යශීලිත්වය

05."ව්‍යාපාරික තීරණයක් සාර්ථක හෝ අසාර්ථක වීමේ අවිනිශ්චිතතාවයක් ඇත." මේ අනුව ව්‍යවසායකත්ව තීරණ,

1) අවදානම් සහගත වේ. 2) නම්‍යශීලි වේ.

3) තාත්වික වේ. 4) කාලානුරූප වේ.

06.ව්‍යවසායකයෙකුට තොරතුරු ( Information ) අවශ්‍ය වනුයේ,

1) බෙදාහැරීම සඳහාය. 2) නිවැරදි තීරණ ගැනීම සඳහාය.

3) ගබඩා කිරීම සඳහාය. 4) සකස් කර ගැනීම සඳහාය.

ව්‍යාපාර වෙනුවෙන් යොදවන මුදල් සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීම ව්‍යවසායකත්වයේ අරමුණකි.

07.ව්‍යවසායකයෙකු වීමේ ප්‍රතිලාභයක් වනුයේ,

1) ස්ථිර ආදායම් මාර්ගයක් ලැබීමය.
2) වගකීම් සීමාසහිත වීම.
3) නිදහස් තීරණ ගැනීමට හැකිවීමය.
4) අවිනිශ්චිතතා මග හරවා ගත හැකිවීමය.

08.රැකියා කරන්නෙකුගේ ඉපැයුම වැටුම වන අතර, ව්‍යවසායකයාගේ ඉපැයුම,

1) ලාභය වේ.
2) ධනය වේ.
3) අතිරික්තය වේ.
4) දිරිගැන්වීම වේ.

09.ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභයක් ලෙස සැලකිය නොහැක්කේ,

1) ඍජු හා වක්‍ර රැකියා උදාවීම.
2) විදේශ විනිමය ඉපැයීම.
3) ජාතික නිෂ්පාදිතය ඉහළ යෑම.
4) විදේශ ආධාර ගලා ඒම.

10.ව්‍යවසායකයෙකු විසින් සැලකිලිමත් වය යුතු කරුණු අතර " පරිසරයට හානි නොකිරීම " යනු ව්‍යාපාර,

1) නීතියකි.
2) ආචාර ධර්මයකි.
3) ප්‍රතිපත්තියකි.
4) අරමුණකි.

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ව්‍යවසායකත්වය යනු කුමක්ද?
   I. ව්‍යවසායකයකු තුල තිබිය යුතු ගුණාංග මොනවාද?
   II. ඔබ ප්‍රදේශයේ ව්‍යවසායකයින් ලැයිස්තුවක් පිළියල කරන්න.
2. ප්‍රධාන නිෂ්පාදන සාධක කීයද ? ඒ මොනවාද?
   I. ඉහත ඔබ දැක් වූ නිෂ්පාදන සාධක කෙටියෙන් පහදන්න.
3. නිර්මාණශීලීත්වය යනු කුමක්ද?
   I. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක 4ක් ලියන්න.
   II. නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි සාධක මොනවාද?
4. ගැටළු නිර්මාණශීලී අදහස් ජනිත කරයි. කෙටියෙන් පහදන්න.
5. නවෝත්පාදනය සිදුවන ආකාර 4ක් ලියන්න.
   I. අවධානම හා ප්‍රතිලාභ අතර සම්බන්ධතාව පහදන්න.

පාඩම/ඒකකය :- ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය

ගුරුභවතාගේ නම :- B.D.R.K.ධනවර්ධන | පාසල :- අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

විෂය :-ව්‍යවසායකත්ව අධ්‍යයනය | ශ්‍රේණිය :- 10

ගැළපෙන පිළිතුර තෝරන්න.

01.ව්‍යාපාර යන්න වඩාත් නිවැරදිව අර්ථ දක්වා ඇති වාක්‍ය තෝරන්න.

(1) ලාභ ලැබීමේ අරමුණින් කරන ඕනෑම කටයුත්තකි
(2) භාණ්ඩ හා සේවා සපයන ඕනෑම ආයතනයකි
(3) සිල්ලර හා තොග වෙළඳ කටයුතුවල නිරත ආයතනයකි
(4) මිනිස් අවශ්‍යතා හා උවමනා සපුරාලන ඕනෑම කටයුත්තකි.

02.මූලික තෘප්තියක් ඉටු කර ගැනීමට අනිවාර්යයෙන් සපුරා ගත යුතු දෑ වන්නේ,

(1) වුවමනාවකි (2) අවශ්‍යතාවයකි
(3) භාණ්ඩ ය (4) සේවා ය

03.අවශ්‍යතා හා උවමනා නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

(1) ආහාර - ඇඳුම් (2) ආරක්ෂාව - නිස්වැසුම
(3) නිවාස - සිමෙන්ති (4) ඇඳුම් - පරිගණකය

04.සේවා සම්බන්ධයෙන් පමණක් අදාළ වන්නේ,

(1) භෞතික පැවැත්මක් ඇත (2) සමජාතීය බව ආරක්ෂා වේ
(3) සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය (4) ගබඩා කළ හැකිය

05.ව්‍යාපාරවල ගති ලක්ෂණ අතරට අයත් නොවන්නේ,

(1) ගනුදෙනු අඛණ්ඩව සිදු වීම (2) අරමුණකින් තොර වීම
(3) අවධානමක් පැවතීම (4) ආර්ථික කටයුත්තක් වීම

06.ව්‍යවසායකයා පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යවසායකයා ගතානුගතික හා සාම්ප්‍රදායික වේ.
(2) ව්‍යවසායකයා තරඟයට මුහුණදීමට කැමැත්තක් නොදක්වයි.
(3) ව්‍යවසායකයා ව්‍යාපාරය පවතින තත්වයෙන් පවත්වා ගැනීමෙන් සෑහීමකට පත් වේ.
(4) ව්‍යවසායකයා දිගුකාලීන දැක්මක් සහිතව දූරදර්ශීව ඉලක්ක පිහිටුවා ගනී.

07.ව්‍යාපාරිකයන් හා ව්‍යවසායකයින් අතර පැවතිය හැකි සමානකමක් විය නොහැක්කේ,

(1) තරඟයට මුහුණ දීම (2) ඉතා ආසන්න ඉලක්ක පැවතීම
(3) සම්පත් භාවිතා කිරීම (4) අවධානමකට මුහුණ දීම

08.ව්‍යවසායකයින් වර්ග කිරීමේදී සිල්ලර වෙළෙන්දා අයිති වන්නේ කුමන ව්‍යවසායකයින් අතරටද?

(1) ව්‍යාපාර ව්‍යවසායකයින්
(2) සමාජයීය ව්‍යවසායකයින්
(3) අභ්‍යන්තර ව්‍යවසායකයින්
(4) ආයතනික ව්‍යවසායකයින්

09.සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයා,

(1) අභ්‍යන්තර ව්‍යවසායකයා වේ
(2) සමාජයීය ව්‍යවසායකයා වේ
(3) ව්‍යාපාර ව්‍යවසායකයා වේ
(4) නිර්මාණශීලී ව්‍යවසායකයා වේ

10.ඔබ පාසලේ විදුහල්පතිතුමා ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලැබූ බව සඳහන් කරන්නේ නම් ඔහු,

(1) ව්‍යවසායකයෙකු නොව විදුහල්පතිවරයෙකි
(2) සමාජයීය ව්‍යවසායකයෙකි
(3) ව්‍යාපාර ව්‍යවසායකයෙකි
(4) අභ්‍යන්තර ව්‍යවසායකයෙකි

පිළිතුරු සපයන්න.

1. ව්‍යාපාරයක් යන්න ඔබ අර්ථකතනය කරන්නේ කෙසේද?

   I. ව්‍යාපාරය හා ව්‍යාපාරිකයා අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

   II. ව්‍යවසායකයා ව්‍යාපාරිකයාගෙන් වෙනස් වන ආකාර 3ක් දක්වන්න.

2. මිනිස් අවශ්‍යතා හා වුවමනා යන සංකල්ප හඳුන්වන්න.

   I. අවශ්‍යතා හා වුවමනා වලට නිදසුන් 4 බැගින් ලියන්න.

3. භාණ්ඩ හා සේවා වල සුවිශේෂී ලක්ෂණ 2 බැගින් ලියන්න.

4.ව්‍යාපාරිකයාට වඩා වැදගත් වන්නේ වුවමනා ය. මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව පැහැදිලි කරන්න.

5. ව්‍යාපාර වල ප්‍රධාන ගති ලක්ෂණ නම් කරන්න.

I.ඉහත ඔබ දැක් වූ ගතිලක්ෂණ අතුරින් 3 ක් පැහැදිලි කරන්න.

II.ව්‍යාපාර ව්‍යවසායකයා නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

III.ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතුරින් වඩා සාර්ථක වන්නේ කවුද ? ඔබේ පිළිතුරට හේතු 2ක් ලියන්න.

IV. ප්‍රධාන ව්‍යවසාකයින් වර්ග නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

V. ඔබ සිත් ගත් සමාජ ව්‍යවසායකයින් 3ක් නම් කරන්න.

VI."ව්‍යවසායකයින්" සමාජය වෙනස් කරයි. මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද ? ඒ ඇයි?

**10 ශ්‍රේණිය**

**03. ඒකකය - ව්‍යවසායකත්ව ප්‍රතිලාභ**

ගුරුවරයාගේ නම - එම්. එච්. සී. නිශාන්ති        පාසල - අම්/පොල්වත්ත මහා විද්‍යාලය

ව්‍යවසායකයා වූ කලි මුළු සමාජයම වෙනස් කළ හැකි අපූරු පුද්ගලයෙකි. ඔහු තම හැකියාවෙන් හා කුසලතාවන් උපයෝගී කරගෙන සමාජයටත් රටටත් විවිධ වූ ප්‍රතිලාභ ලබා දේ. අද වන විට බොහෝ රටවල් සංවර්ධිත තත්ත්වයට පත්ව ඇත්තේ එවන් ව්‍යවසායකත්ව ප්‍රතිලාභ තුළිනි. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයා තමාට පමණක් නොව තම ප්‍රදේශයට ද රටට ද විවිධ වූ ප්‍රතිලාභ අත් කර දෙයි.

- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ව්‍යවසායකත්ව ප්‍රතිලාභ ප්‍රධාන ආකාර,

    1). 5 කි.    2). 3 කි.    3). 2 කි.    4) 4 කි.

02. බොහෝ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර සාර්ථක වී ඇත්තේ .................................... හා .................................... කටයුතු කිරීම නිසාය. හිස්තැනට ගැලපෙන පිළිතුර තොරන්න.

    1). නිදහසේ හා වේගයෙන්    2) ඇල්මෙන් හා සතුටෙන්

    3). කාර්යක්ෂමව සහ වේගයෙන්    4). සතුටෙන් හා ඉක්මනින්

03. ව්‍යවසායකයා සැම විටම උත්සහ කරනුයේ පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව

    1) අඩු මිලට විකිණීමට ය.    2) ගුණත්වයෙන් විකිණීමටය.

    3) නව්‍යතාවයකින් විකිණීමට ය.    4) පහසුවෙන් ලබා දීමට ය.

04. සාර්ථක ව්‍යවසායකයකුට තම පරිභෝජනය ඉහළ තත්ත්වයක පවත්වා ගැනීමට හැකි වී ඇත්තේ

    1) භාණ්ඩ හා සේවා තමාම නිපදවන නිසාය    2) වෙළඳපොළේ විවිධ භාණ්ඩ තිබෙන නිසා ය.

    3) ඉහල ඉපයීමක් ලබන නිසා ය    4) වෙළඳපල දියුණු නිසාය

05. සුනිමල් බොහෝ කාලයක ලද අත්දැකීම් හා හැකියාවන් පදනම් කරගෙන තම ප්‍රදේශයේ තේ කම්හලක් ආරම්භ කරන ලදී. මෙයින් දේශීය ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ,

    1) ස්වයංපෝෂිත බව    2) රැකියා අවස්ථා ජනනය වීම

    3) දේශීය සම්පත් උපයෝජනය    3) ප්‍රාදේශීය සංවර්ධනය

06. ව්‍යවසායකයා තමාගේ ස්වාමියා තමාම බව දැඩිසේ විශ්වාස කරයි. මෙයින් කියවෙන ව්‍යවසායකත්ව ප්‍රතිලාභය වන්නේ,

    1) නිදහස තුළින් ඉතා ඉහළ තෘප්තියකට පත්වීම

    2) ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම

    3) කාර්යයන් හි විවිධත්වයක් පැවතීම

    4) ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකි වීම

"ව්‍යවසායකයා අපූරු පුද්ගලයෙකි .බොහෝ රටවල් සංවර්ධිත තත්වයට පත්ව ඇත්තේ ව්‍යවසායකත්ව ප්‍රතිලාභ හේතුවෙන් ව්‍යවසායකත්වය ව්‍යවසායකයාට, ප්‍රදේශයට,රටට බොහෝ ප්‍රතිලාභ අත්කර දෙයි."

07) ව්‍යාපාර සාර්ථක වූ විට සමාජීය වශයෙන් විවිධ ප්‍රතිලාභ හිමිවීම නිරායාසයෙන් සිදු වේ. එවන් ප්‍රතිඵලයක් නොවන්නේ,

1) සමාජීය වශයෙන් ඇතිවන පිළිගැනීම.
2) නායකත්වය හිමිවීම.
3) කීර්ති ප්‍රශංසා හිමි වීම
4) තම ව්‍යාපාරයේ වත්කම් වැඩි වීම

08) තරිඳු චිත්‍ර ශිල්පයෙහි විශේෂ හැකියාව ඇත්තෙකි. ඇඳිම, කැටයම් වැඩ, ඇඹීම වැනි සුවිශේෂී හැකියාවන් ඔහුට ඇත. ඔහු රැකියාව කළ චමත්කාර ෆ්ලෝරා හි ඔහු කලේ චිත්‍ර ඇඳිම පමණි. මෙයින් සෑහිමකට පත් නොවූ ඔහු තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර එහි ඔහු තුළ වූ බොහෝ හැකියාවන් තුළින් නවෝත්පාදන වෙළඳපොලට ඉදිරිපත් කරන ලදී. මෙම සිද්ධියට අදාළව තරිඳුට ලැබෙන ප්‍රතිලාභ අතුරෙන් සුවිශේෂී ප්‍රතිලාභය වන්නේ,

1) ස්වයං පෝෂිත බව
2) ප්‍රයෝජනයට නොගත් හැකියාවන් යොදාගත හැකි බව
3) ආකර්ෂණීය ලාභ ඉපයීම
4) ස්වකීය දෛවය තමා තුළම රැඳී සිටීම

09) පහත සඳහන් අවස්ථා අතුරෙන් යම් පුද්ගලයකුට ව්‍යවසායකත්ව ප්‍රතිලාභ ලබාගත නොහැකි වන්නේ,

1) අවදානම් හා අභියෝග භාර ගැනීමට ඇති අකමැත්ත.

2) යැපුම් මානසිකත්වයක් තිබීම.

3) වැටුප් ලබන රැකියාවක ඇති පිළිගැනීමට ඇති කැමැත්ත.

4) ඉහත සියල්ලම.

10) ව්‍යවසායකත්වය මගින් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයක් නොවන්නේ,

1) ආකර්ෂණීය ලාභ ඉපයීම.

2) ස්වයංපෝෂිත බව

3) නිදහස තුළින් ඉතා ඉහළ තෘප්තියකට පත්වීම.

4) ප්‍රාදේශීය සංවර්ධනය සිදු වීම.

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුරු ලියන්න.**

11. ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ ආකාර මොනවාද ?

12. ව්‍යවසායකත්වයෙන් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රතිලාභ 06 ක් නම් කරන්න.

13. ආර්ථිකය ශක්තිමත් වීම හේතුවෙන් විදේශ රටවල් මත යැපීමට සිදු නොවේ. ව්‍යවසායකත්වය වර්ධනය වීමෙන් රටක සංවර්ධනය වන ක්ෂේත්‍ර 03 ක් ලියන්න.

14. ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ 06 ක් නම් කරන්න.

15. ව්‍යවසායකයකුට සමාජ සුභ සාධනය සඳහා දායක විය හැකි ආකාර 4ක් දක්වන්න.

---

I. කොරෝනා වසංගත තත්වය යටතේ බිහි වූ නව ව්‍යවසායකත්ව අවස්ථා 3ක් ලියන්න.

II. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන් ඉක්මනින් බංකොලොත් වීමට බලපෑ හැකි හේතු 4ක් ලියන්න.

III. ඔබ ප්‍රදේශයේ ව්‍යවසායකයින් දෙදෙනෙකු නම් කර ඔවුන්ගෙන් ප්‍රදේශයට ලැබී ඇති ප්‍රතිලාභ 3 බැගින් ලියන්න.

IV. '"ව්‍යවසායකයකු වීම පෞද්ගලිකව තමාට මහත් ප්‍රතිලාභ ගෙන දෙයි." මේ ප්‍රකාශයට පක්ෂව හේතු 3ක් ඉදිරිපත් කරන්න.

| | | |
|---|---|---|
| විෂය | - | ව්‍යවසායකත්ව අධ්‍යයනය - 10 ශ්‍රේණිය |
| පාඩම | - | ව්‍යවසායකත්වය හා කුඩා පරිමාණ ව්‍යාපාර |
| ගුරුවරයාගේ නම | - | එච්. එම්. දර්ශනී කුමාරි - අම්/ ගාමිණී මහ විද්‍යාලය |

I - කොටස

01. කුඩා ව්‍යාපාර යන්න නිර්වචනයේදී අදාළ නොවන පාරිභාෂිත පදය වන්නේ,

I කුඩා සේවක සංඛ්‍යාව II අඩු ආයෝජනය

III රාජ්‍ය හිමිකාරිත්වය IV ස්වාධීන වීම

02. පරිමාණය මත ව්‍යාපාර වර්ග කිරීමේ දී අදාළ නොවන වර්ණය වන්නේ,

I. කුඩා පරිමාණ ව්‍යාපාර II ස්වයං රැකියා

III මධ්‍යම පරිමාණ ව්‍යාපාර IV මහා පරිමාණ ව්‍යාපාර

03. "ශ්‍රී ලංකාවේ දළජාතික නිෂ්පාදිතයට කුඩා ව්‍යාපාර වලින් ලැබෙන්නේ සුළුපටු දායකත්වයක් නොවේ. ඒ නිසා රජය විසින් කුඩා ව්‍යාපාර ආරක්ෂා කර ගැනීමට දිරි ගැන්වීම් බොහොමයක් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි." කුඩා පරිමාණ ව්‍යාපාරයක ගති ලක්ෂණයකි,

I. අයිතිකරුවන් කිහිප දෙනෙකු මත ව්‍යාපාරය පැවතීම.

II. තනි තීරණ ගැනීමේ අපහසුව.

III. ව්‍යාපාරය කුඩා ප්‍රදේශයක ව්‍යාප්ත වී තිබීම.

IV. සැලකිය යුතු ප්‍රාග්ධනයක් ආයෝජනයට අවශ්‍ය වීම.

04.කුඩා ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තියකි.

I. දේශීය තාක්ෂණය භාවිතා කල හැකි වීම.

II. සේවකයින් වැඩි වරප්‍රසාද ඉල්ලීම.

III. සේවක කුසලතා අවම වීම.

IV. නව තාක්ෂණයට පහසුවෙන් අනුගත වීම.

05.කුඩා ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි සීමාවකි,

I. පවුලේ සාමාජිකයන්ගේ සහාය ලබා ගත හැකි වීම.

II. නවීන තාක්ෂණය භාවිතා නොවීම.

III. ව්‍යාපාරයට ප්‍රාග්ධනය රැස් කර ගැනීමේ මාර්ග බහුල වීම.

IV. වෙළඳපල පුලුල් වීම.

06. අයිතිය අනුව ව්‍යාපාර වර්ගීකරණය නිවැරදිව දක්වා ඇත්තේ,

I පෞද්ගලික හා රාජ්‍ය　　II ප්‍රාථමික , ද්විතීයික හා තෘතීයික

III සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ　　IV කෘෂි කාර්මික හා සේවා

07.පහත දැක්වෙන භූමිකා අතුරින් ව්‍යවසායකත්ව භූමිකාවක් නොවන්නේ,

I කළමණාකරු　　II නායකයා　　III අයිතිකරු　　IVපාලකයා

08.සේවකයන් පෙළඹවීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.

I පාලකයාගේ කාර්යයකි　　II අයිතිකරුගේ කාර්යයකි

III නායකයාගේ කාර්යයකි　　IV කළමනාකරුගේ කාර්යයකි

09.නව නිෂ්පාදන බිහි කිරීම

I තාක්ෂණික කුසලතාවයකි　　II සංකල්පනාත්මක කුසලතාවයකි

III සන්නිවේදන කුසලතාවයකි　　IV මානව කුසලතාවයකි

10.ශ්‍රී ලංකාවේ වැඩිපුරම හඳුනා ගත හැක්කේ,

I කුඩා ව්‍යාපාර　　II මධ්‍ය පරිමාණ ව්‍යාපාර

III මහා පරිමාණ ව්‍යාපාර　　IV කෘෂි ව්‍යාපාර

11.දේශීය ආර්ථිකයට කුඩා ව්‍යාපාර වලින් ලැබෙන දායකත්වයන් 4ක් ලියන්න.

I. මහා පරිමාණ ව්‍යාපාර වල පැවැත්මට ඉවහල් වන කුඩා ව්‍යාපාර 2ක් නම් කරන්න.

12.කුඩා ව්‍යාපාරයක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

I.පරිමාණය මත ව්‍යාපාර වර්ග කරන්නේ කෙසේද?

II.ඉහත ඔබ දැක් වූ ව්‍යාපාර වර්ග අතුරින් රජයේ මැදිහත් වීම වඩා අවශ්‍ය වන්නේ කුමන ව්‍යාපාර වර්ගයටද? හේතු 2ක් ලියන්න.

13.කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථකව පවත්වා ගෙන යාමට ඔබගේ යෝජනා 3ක් දක්වන්න.

I.කුඩා ව්‍යාපාර වල දැකිය හැකි ගතිලක්ෂණ 4ක් ලියන්න.

14.ප්‍රධාන ව්‍යවසායකත්ව භූමිකා මොනවාදැයි දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

I.කුඩා ව්‍යාපාරයක් අසාර්ථක වීමට බලපාන හේතු 3ක් ලියන්න.

II.කුඩා ව්‍යවසායකයකු ලෙස ආරම්භ කර සාර්ථක ව්‍යවසායකයකු බවට පත් වී ඇති ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන් 2ක් නම් කරන්න.

15.ව්‍යවසායකයකු වර්ධනය කර ගත යුතු කුසලතා අතර මානව කුසලතා වැදගත් යන අවස්ථා 3ක් ලියන්න.

විෂය:- ව්‍යවසායකත්ව අධ්‍යයනය

ශ්‍රේණිය:- 10

පාඩම්/ඒකකය:- 5 ව්‍යාපාර පරිසරය

ගුරුවරයාගේ නම:- එම්. ඩී. අයි. ආර්. අමරනායක.

පාසල:- අම්/වැරැන්කැටගොඩ ජාතික පාසල

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01.ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට පමණක් අදාල සාධකය වන්නේ.

(1) අයිතිකරුවෝ,නිෂ්පාදකයෝ, සේවකයෝ, සම්පත්,

(2) අයිතිකරුවෝ,නිෂ්පාදකයෝ, සේවකයෝ, සම්පත්,

(3) අයිතිකරුවෝ,කළමණාකරුවෝ,සේවකයෝ, සම්පත්,

(4) අයිතිකරුවෝ,ප්‍රජාව, සේවකයෝ, ආර්ථිකය,

02. ව්‍යාපාර කටයුතුවලදී බලපෑම්කරණු ලබන ව්‍යාපාර තුළ ඇති සාධක සියල්ලම ඇතුළත් වන්නේ

(1)බාහිර පරිසර සාධක වලටය. (2) අභ්‍යන්තර පරිසර සාධකවලටය.

(3) ආසන්න පරිසර සාධක වලටය. (4) ව්‍යාපාරික පරිසර සාධක වලටය.

03. මෑතකදී දිස්ත්‍රික්ක කිහිපයක පැවති ගංවතුර හා නායයෑම් නිසා ව්‍යාපාරික ස්ථාන රාශියක් හා කෘෂිකාර්මික වගා බිම් හානියට පත්විය. මෙම බලපෑමඅයත්වන්නේ.

(1) ආසන්න පරිසරයටය. (2) ගෝලීය පරිසරයටය.

(3) ස්වාභාවික පරිසරයටය. (4) ප්‍රජාපරිසරයටය.

04. අතීතයේ පැවති ව්‍යාපාර පරිසරයට වඩා ප්‍රබල වෙනස්කම් නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකිය. එසේ ඇති වූ ප්‍රබල වෙනස්කමක් වන්නේ.

(1)ව්‍යාපාරිකයෝ බලවත් වීමය (2) පාරිභෝගිකයින් බලවත් වීමය.

(3) ලාභය ප්‍රධාන අරමුණ වීමය. (4) තරගකාරිත්වය අඩුවීමය.

05. ව්‍යාපාර පරිසරය තුළ ඇති සැබෑ වෙනස්කම් අවබෝධකර ගැනීම තුළින් ව්‍යවසායකයාට ප්‍රයෝජන රාශියක් අත්පත්කර ගතහැකි වේ.අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි වන්නේ.

(1) අවස්ථා හා තර්ජනයි. (2) ශක්තීන් හා දුර්වලතායි.

(3) අවස්ථා හා දුර්වලතායි.(4) ශක්තීන් හා අවස්ථායි.

06. ව්‍යාපාර බාහිර පරිසරය තුළ අඩංගු සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ.

(1)සේවකයින්, කළමණාකරුවන් හා අයිතිකරුවන

(2) පොළී අනුපාතය, මිළ මට්ටම් හා සේකයින්

(3) පොළී අනුපාතිකය, රාජ්‍ය ප්‍රතිපත්ති හා චාරිත්‍ර වාරිත්‍ර

(4) සාරධර්ම, මිළමට්ටම් හා අයිතිකරුවන්.

07. දේශිය ව්‍යාපාර සඳහා ගෝළීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමක් වන්නේ.

(1) දැඩි තරඟකාරිත්වයට මුහුණ දීමට සිදුවීමය.

(2) කාර්යක්ෂම යන්ත්‍රසූත්‍ර ලබාගත හැකිවීමය.

(3) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.

(4) දේශීය භාණ්ඩ සඳහා විදේශ වෙළෙඳපල ලබාගත හැකි වීමය.

08. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ යටතේ ඇති ප්‍රාථමික අංශයට අයත් නොවන කර්මාන්තය වන්නේ.

(1)දැව කර්මාන්තය. (2) හුණුගල් කර්මාන්තය.

(3) මැණික් කර්මාන්තය. (4) ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය.

09. අනෙකුත් රටවලට සාපේක්ෂව සළකා බලන විට අප රටේ සුලභව ඇති මානව නොවන සම්පතක් වන්නේ.

(1) ඛනිජ සම්පත්ය. (2) පුහුණු ශ්‍රම සම්පතය.

(3) ව්‍යවසායකයින්ය. (4) කොරල්පරය.

10. ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවයක් නොවන්නේ.

(1) නව තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතය.

(2) පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරුව.

(3) ගෝලීයකරණය.

(4) ප්‍රවාහනය මුලාසේවා හා සන්නිවේදන සේවා සඳහා ඉල්ලුම අඩුවීම.

පිළිතුරු සපයන්න.

1. ව්‍යාපාර පරිසරය කොටස් දෙකකට බෙදිය හැකිය. ඒවා නම් කරන්න.
2. බාහිර සාධක හතරක් නම් කරන්න.
3. ශ්‍රී ලංකාවේසුලභව ඇති මානව නොවන සම්පත් වර්ග කිහිපයකට බෙදිය හැකිය.ඒවා නම් කරන්න.
4. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ නම් කරන්න.
5. ව්‍යාපාර පරිසරය තුළ සිදුවෙමින් පවතින නව ප්‍රවණතා හතරක් නම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| විෂය | - | ව්‍යවසායකත්ව අධ්‍යයනය - 10 ශ්‍රේණිය | | |
| පාඩම | - | ව්‍යාපාර ආරම්භයට ප්‍රවේශයක් | | |
| ගුරුවරයාගේ නම | - | ඩී.ජී.ආර්. රත්නසිලී | - | කලාප අධ්‍යාපන කාර්යාලය- අම්පාර |

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ව්‍යාපාරයක් යන්න අර්ථ දැක්වීම සඳහා වඩාත් උචිත ප්‍රකාශය තෝරන්න.
   I. භාණ්ඩ නිශ්පාදනය හෝ බෙදාහැරීම සිදු කරන ඕනෑම සංවිධානයකි.
   II. භාණ්ඩ හා සේවා නිශ්පාදනය හෝ බෙදාහැරීම සිදු කරන ඕනෑම කටයුත්තකි.
   III. මානව අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා වන ඕනෑම ආර්ථික කටයුත්තකි.
   IV. මිනිස් අවශ්‍යතා ඉටුකරනු ලබන භාණ්ඩ හා සේවා නිශ්පාදනය බෙදාහැරීම සිදු කරන ආර්ථික කටයුත්තකි.

2. ඉලක්කගත පාරිභෝගිකයා යනු,
   I. ව්‍යාපාරියකයා ඉදිරිපත්කරන භාණ්ඩය ඉල්ලුම්කරනු ලබන පාරිභෝගික කොටසයි.
   II. ව්‍යාපාරියකයා ඉදිරිපත්කරන භාණ්ඩය හෝ සේවය දැනටමත් පාරිභෝජනය කරන්නන් හා අනාගතයේ පාරිභෝජනය කිරීමට ඉඩ ඇති පාරිභෝගික කොටසයි.
   III. අනාගතයේ වෙළඳපලට ඉදිරිපත්කරනු ලබන භාණ්ඩ හෝ සේවා සඳහා ඇති වෙළඳපල කොටසයි.
   IV. වෙළඳපලේ සිටින ළමා, තරුණ, වැඩිහිටි, කාන්තා, පිරිමි හා අන්තර් ජාතිකව විසිරි සිටින ජනකොට්ඨාසයයි.

3. පහත සඳහන් ව්‍යාපාර කටයුත්ත සඳහා උචිත ස්ථානය නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.
   I. රෙදිසාප්පුවක් - ප්‍රදර්ශනය සඳහා ඉඩකඩ ඇති ජනාකීර්ණ ස්ථානයක්
   II. උත්සව ශාලාවක් - වාහන පහසුකම් සහිත ජනාකීර්ණ ස්ථානයක්
   III. තොග ගබඩාවක් - මාර්ග පහසුකම් සහිත ජනාකීර්ණ ස්ථානයක්
   IV. තැපැල්මාර්ගික හෝ online පාඨමාලා පැවැත්වීම - ප්‍රාදේශීය ජනාකීර්ණ ආකර්ශනීය ස්ථානයක්

4. ලලන්ත කුමාරසිංහ ගමන් මලු නිපදවීමේ ව්‍යාපාරයක් කරගෙන යයි. ඔහු ඉලක්ක කරගත් පාරිභෝගික කොටස් හා ගමන් මලු වර්ගය නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.
   I. ළමුන්ට - සංචාරක ගමන් මලු
   II. රැකියා කරන කතුන්ට - කාන්තා අත් බෑග්
   III. සංචාරකයින්ට - කුඩා අත් බෑග්
   IV. රැකියා කරන පිරිමින්ට - සංචාරක ගමන් මලු

5. නව ව්‍යවසායකයකුට වෙළඳපළට ප්‍රවේශ විය හැකි විකල්ප ක්‍රමයක් නොවන්නේ,
   I. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් විදේශ වෙළඳපලට ඉදිරිපත් කිරීම.
   II. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම.
   III. නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම.
   IV. නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම.

6. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම,
   I. අවධානම් නැති අවස්ථාවකි.
   II. අවධානම හා ප්‍රතිලාභ සමාන අවස්ථාවකි.
   III. ඉහළ ප්‍රතිලාභ සහිත අවස්ථාවකි.
   IV. තරඟකරුවන් රාශියක් සිටින නිසා අවධානම ඉහළ අවස්ථාවකි.

7. නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලකට සැපයීමේ ප්‍රධානතම වාසිය වන්නේ,
   I. තරඟකරුවන් අඩු නිසා වාසි අත්පත් කරගත හැකි වීමයි.
   II. තරඟකරුවන් නොමැති නිසා වෙළඳපල කොටස අනාගතයේ අත්පත් කරගත හැකි වීමයි.
   III. පාරිභෝගිකයින් විශාල ප්‍රමාණයක් සිටින නිසා උපක්‍රමශීලී ලෙස වෙළඳපල ජයගත හැකිවීමයි.
   IV. පාරිභෝගිකයින් ආකර්ශනය කරගෙන ඉහළ ලාභ උපයාගත හැකිවීමයි.

8. නව නිෂ්පාදනයක් වෙළඳපලට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකයකුට භාවිතා කල හැකි ක්‍රමවේදයක් වන්නේ,
   I. SCAMPER ආකෘතිය
   II. සාර්ව විශ්ලේෂණය
   III. SWOT Analysis
   IV. සූක්ෂම විශ්ලේෂණය

9. නව ව්‍යාපාරයක් සඳහා පිවිසුම් උපායමාර්ගයක් නොවන්නේ,
   I. සුවිශේෂී නව භාණ්ඩ හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
   II. නිශ්පාදන ප්‍රභේදන භාවිතා කරමින් ඉදිරිපත් කිරීම.
   III. විශාල වශයෙන් ගුණාත්මක භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කිරීම.
   IV. වෙළඳපල හිඩැස දැක භාණ්ඩ ඉදිරිපත් කිරීම.

10. ව්‍යාපාර ස්ථානයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධකයක් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   I. ගණුදෙනුකරුවන්ගේ ප්‍රමාණය හා ඔවුන්ගේ විසිරීම, අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව.
   II. ශ්‍රමය ලබා ගැනීමේ පහසුව, අයිතිකරුවන්ට ප්‍රමාණවත් ලාභයක් ලබා දීම.
   III. මිලදී ගැනීම සඳහා ගෙවීම, අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව.
   IV. වියදම් පියවාගත හැකිවීම, භූමියේ පිරිවැය.

- පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.
  - ✓ වෙළඳපල පිරිවැය
  - ✓ නවෝත්පාදනය, නිෂ්පාදිත ප්‍රභේදනය
  - ✓ ඉලක්ක පාරිභෝගිකයා
  - ✓ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සාර්ථක පිවිසුම් මාර්ග
  - ✓ SCAMPER ආකෘතිය

| | | |
|---|---|---|
| විෂය | :- ව්‍යවසායකත්ව අධ්‍යයනය | ශ්‍රේණිය :- 10 ශ්‍රේණිය |
| පාඩම් ඒකකය | :- ව්‍යාපාර අදහස් හා අවස්ථා | |
| ගුරුවරයාගේ නම | :- එච්.එම්. දශර්නි කුමාරි | |
| පාසල | :- අම්/ගාමිණී මහ විදුහල. | |

01. ව්‍යාපාර අදහසක ලක්ෂණයක් නොවේ.

i. පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම.
ii. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.
iii. ස්වකීය ව්‍යාපාර අදහස ආරක්ෂා කර ගත හැකි වීම.
iv. වෙනස් වන අවශ්‍යතා හා වුවමනාවන්ට ප්‍රතිචාර දැක්වීම අපහසු වීම

02.ව්‍යාපාර අදහස් ජනනය විය හැකි මූලාශ්‍රයක් නොවේ.

I අධ්‍යාපන පාඨමාලා
II ප්‍රදර්ශණ හා අත්දැකීම්
III පාරිභෝගික ප්‍රතිචාර
IV රාජ්‍ය අංශයේ ව්‍යාපාර

03.ව්‍යාපාර අවස්ථාවක පමණක් දැකිය හැකි ලක්ෂණයකි.

I විවෘත වීම
II ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වීම
III විශාල ප්‍රමාණයකින් ජනනය වීම
IV විවිධ මූලාශ්‍ර මත ඇති වීම

04.යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ පළමු පියවර

I සූක්ෂම විශ්ලේෂණය
II සාර්ව විශ්ලේෂණය
III ශදුඅත විශ්ලේෂණය
IV PEST විශ්ලේෂණය

05. ශදුඅත විශ්ලේෂණයේ දී ශක්තීන් සඳහා උදාහරණයක් නොවන්නේ,

I මූල්‍ය ස්ථාවරත්වය
II තරඟකරුවන් කර්මාන්තයෙන් ඉවත් වීම
II හිතකර දේශපාලන වතාවරණය
IV රාජ්‍ය දිරිගැන් වීම

06.අවස්ථා සඳහා උදාහරණයකි.

I සම්පත් පැවතීම
II තාක්ෂණය දියුණු වීම
III නිෂ්පාදන වල ගුණාත්මක බව ඉහල යාම
IV අමුද්‍රව්‍ය හිඟ වීම

07.බාහිර පරිසරයේ අයහපත් බලපෑම්

I දුර්වලතා ය
II තර්ජන ය
III බාධාවන් ය
IV සීමාවන් ය

08.සාර්ව විශ්ලේශණයන් මගින් තෝරා ගන්නා ව්‍යාපාර අදහස්

I 100 කි
II 10 කි
III 1000 කි
IV 500 කි

09. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. පහත සඳහන් දෑ අතුරින් අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් පිළිතුරු තෝරාගන්න.

i. අයිතිකරු, කළමණාකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන්
ii. අයිතිකරුවන්, කළමණාකරුවන්, සේවකයන්, සංස්කෘතිය
iii. ආර්ථිකය, සමාජ හා සංස්කෘතිය, තාක්ෂණය, තරඟකරුවන්
iv. ආර්ථිකය, සමාජ හා සංස්කෘතිය, කළමණාකරුවන්, තරඟකරුවන්

10. " කිරි පිටි විකිණීම ශ්‍රී ලංකාව තුළ ලබන වසරේ සිට තහනම් කෙරේ" ඉහත තත්වය යටතේ කෙනෙක් තුළ ඇති විය හැකි ව්‍යාපාර අදහසක් නොවන්නේ,

i. ගව අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම
ii. දියර කිරි ජංගම අලෙවි රථ මඟින් අලෙවිය
iii. යෝගට් නිෂ්පාදනය වැඩි කිරීම
iv. දියර කිරි එකතු කිරීමේ ජංගම රථ සේවාවන්

11.ව්‍යාපාර අදහසක් යනු කුමක්ද?

I.ඔබේ පියාට රු. 100 000 ක ලොතරැයි දිනුමක් ඇදුනේ යැයි සිතා එම මුදල් ආයෝජනය කල හැකි යැයි ඔබ සිතන නව ව්‍යාපාර අදහස් 3ක් ලියන්න.

12.හොඳ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණ මොනවාද?

I.ව්‍යාපාර අවස්ථා අතුරින් යෝග්‍ය අවස්ථාවක් තෝරා ගැනීමට හොඳ ව්‍යාපාර අදහස් තෝරා ගැනීම සඳහා අනුගමනය කල යුතු පුනීල ආකෘතිය පැහැදිලි කරන්න.

13.යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ පියවර අතුරින් සූක්ෂම විශ්ලේෂණය සඳහා භාවිතා කල හැකි නිර්නායක 4ක් ලියන්න.

14.ව්‍යාපාර අවස්ථා හා අදහස් අතර සැසඳීමක් කරන්න.

I.වර්තමානයේ ප්‍රබල ලෙස සාකච්ඡාවට භාජනය වන ගොවීන්ට කාබනික පොහොර සැපයීම සඳහා යෝජනා කල හැකි ධනාත්මක අදහස් 4ක් ලියන්න.

15.ව්‍යාපාරයකට මතුවිය හැකි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන 2 බැගින් ලියන්න.

I.පේටන්ට් අයිතිය ලබා දෙන නව සොයා ගැනීම් වලට අයත් දෑ මොනවාද?